**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව - 2020**

-------------------------------------------------------------------

**1.1 මතය**

**-------------**

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ("කොමිෂන් සභාව") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**--------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**-----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය**

**-------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලවකොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කොමිෂන් සභාව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය, ශුද්ධ මෙහෙයුම් වියදම් සඳහා සෙස් අරමුදලින් මාරුකිරීම් සැලකිල්ලට ගැනීමට පෙර රු. මිලියන 385.2 ක ඌණතාවයක් වූ අතර ඉකුත් වර්ෂයේදී ඌණතාවය රු.මිලියන 375.4 ක් ලෙස වාර්තා විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ඌණතාවය රු. මිලියන 9.8 කින් හෙවත් සියයට 14.4 කින් වැඩි වීම සඳහා මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය යටතේ වූ ප්‍රදානය රු.මිලියන 11.7 කින් අඩුවීම ප්‍රධාන හේතුව විය.

**2.2** **ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ ප්‍රධාන ආදායම් සහ වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර පහත පරිදි දක්වා ඇත.

| | **2020** | **2019** | **වෙනස ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|
| | රු. | රු. | |
| **කොමිෂන් සභාවේ ආදායම** | | | |
| පොලී ආදායම | 5,360,805 | 3,728,019 | 43.79 |
| රජයේ ප්‍රදාන | 11,720,560 | 81,124,254 | (85.55) |
| **කොමිෂන් සභාවේ වියදම්** | | | |
| සේවක වැටුප් | 132,419,676 | 128,380,689 | 3.15 |
| විශේෂ ගෙවීම් | 16,606,045 | 16,812,135 | (1.23) |
| සේවක වාහන දීමනා | 23,298,500 | 22,344,097 | 4.27 |
| සේවක වෛද්‍ය වියදම් හා රක්ෂණය | 7,914,882 | 6,962,971 | 13.67 |
| සේවක සුබසාධනය | 4,052,758 | 5,896,137 | (31.26) |
| විදේශීය පුහුණුව සහ සංචාර | 2,309,872 | 13,547,075 | (82.95) |
| කුලී සහ කාර් පාක් කුලී | 96,216,435 | 88,188,786 | 9.1 |
| ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන වියදම් - එකතුව | 32,376,005 | 53,736,624 | (39.75) |
| • ප්‍රාග්ධන වෙළඳපොල හා නිෂ්පාදන සංවර්ධනය | 16,920,166 | 24,669,537 | (31.41) |
| • මහ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් | 1,354,648 | 13,407,274 | (89.90) |
| • අධ්‍යාපන වැඩසටහන් | 1,609,193 | 3,480,812 | (53.77) |
| • ජාත්‍යාන්තර සාමාජිකත්ව ගාස්තු - අයි.ඕ.එස්.සී.ඕ | 3,684,862 | 3,730,324 | (1.22) |
| • ප්‍රසිද්ධිය සහ ප්‍රචාරණය | 0 | 482,114 | (100) |
| • වෙළඳපොල පරීක්ෂණ පිරිවැය | 8,795,002 | 7,878,105 | 11.64 |
| • විමර්ශනය සහ පරීක්ෂාකිරීමේ වියදම් | 3,134 | 88,458 | (96.46) |

අ. ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ කොටසක් ලෙස, නම් කරන ලද ව්‍යාපෘති 11 ක් සඳහා දළ වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 10 ක් ලබා ගැනීමට කොමිෂන් සභාව හිමිකම් ලබයි. සමාලෝචිත වර්ෂය අවසානයේදී, ව්‍යාපෘතියේ ප්‍රතිඵල පදනම් කරගත් මූල්‍ය සංරචකයේ කොටසක් ලෙස කොමිෂන් සභාවට එකතුව රු. මිලියන 92.84 ක් (2019 දී රු. 81,124,254 ක් හා 2020 දී රු. 11,720,560 ක් වශයෙන්) ලැබී තිබුණි. 2019 වර්ෂය තුළදී දරණ ලද රු. මිලියන 1 ක සාමාන්‍ය වියදම් හැරෙන්නට, ප්‍රතිඵල පදනම් කරගත් මූල්‍ය සංරචකයට අදාළව කිසියම් නිශ්චිත වියදමක් කොමිෂන් සභාව විසින් දැරීමට අවශ්‍ය නොවේ. ඒ

අනුව, ඉහත දක්වන ලද මුදල් ප්‍රමාණයන් සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂය සඳහා ආදායම් (රජයේ ප්‍රදාන) ලෙස හඳුනාගෙන තිබුණි. තවද, ආයෝජන ව්‍යාපෘති මූල්‍යකරණ සංරචකයේ කොටසක් ලෙස සමාලෝචිත වර්ෂය තුළදී ලැබුණු රු. 558,060 ක මුදලක් අපේක්ෂිත අරමුණ සඳහා 2020 වර්ෂය තුළදී භාවිතා කර නොතිබුණි.

ආ. ප්‍රාග්ධන වෙළඳපොළ හා නිෂ්පාදන සංවර්ධනය සඳහා සමාලෝචිත වර්ෂයේ වියදම රු. මිලියන 16.9 ක් විය. එහි ප්‍රධාන වශයෙන් තැරැව්කරුවන්ගේ පසුපෙළ කාර්යාල පද්ධතිය (Broker Back Office Systems) සහ ඇණවුම් කළමනාකරණ පද්ධතිය (Order Management System) සඳහා වැය කරන ලද රු. මිලියන 16.8 ක් හෙවත් සියයට 99.4 ක් ඇතුළත් විය.

ඇ. 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 14 බි (2) අ වගන්තිය ප්‍රකාරව, ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය කිරීමේ අරමුණ සඳහා එම පනත යටතේ අයකරනු ලබන සෙස් බදුවලින් වියදම් දැරීමට බලය දී තිබේ. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන කටයුතු සඳහා මුළු වියදමෙන් සියයට 7.4 ක් වැය කර තිබුණු අතර ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේදී එය සියයට 11.8 ක් විය. ‘

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ | විමර්ශන අංශය විසින් හසුරුවන ලද සිද්ධීන් 32 ක් අතුරින්, සිද්ධීන් 11 ක විමර්ශන සම්පූර්ණ කර තිබුණු අතර 2013 ජුලි මාසයේ සිට 2019 ඔක්තෝබර් මාසය දක්වා කාලය තුළදී ලියාපදිංචි කළ අනෙකුත් සිද්ධීන් 21 හි විමර්ශන කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට කෙරීගෙන යමින් පැවතුණි. | 2021 සැප්තැම්බර් 30 වන විට, විමර්ශන වාර්තා සහ වෙනත් වාර්තා 9 ක් කොමිෂන් සභාවට සහ කොමිෂන් සභාවේ ආවේක්ෂණ හා විමර්ශන කමිටුව වෙත ඉදිරිපත් කිරීමට විමර්ශන අංශයට හැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2020 වර්ෂයේදී විමර්ශන අංශය විසින් හසුරුවන ලද විමර්ශන 32 ක් අතුරින් විමර්ශන 12 ක් පමණක් 2020 සැප්තැම්බර් 30 වන විට කෙරීගෙන යමින් පැවතුණි. එම විමර්ශන 12 අතුරින්, විමර්ශන 5 ක් ඒවායේ නිම කිරීමේ අවසාන අදියරේ පවතී. ඉතිරි විමර්ශන 7 සාධාරණ කාල පරිච්ඡේදයක් තුළ අවසන් කිරීමට විමර්ශන අංශය සැළසුම් කරමින් සිටියි. | දැනට පවතින විමර්ශන අවසන් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම. |
| ආ | මධ්‍යම පාර්ශ්වීකරණ යාන්ත්‍රණය (Central Counter Party Mechanism - CCP) ක්‍රියාත්මක කිරීමේ පියවරක් ලෙස ක්‍රියාත්මක කරනු ලබන භාරදීමට එරෙහිව ගෙවීම් (Delivery Versus Payment - DvP) ක්‍රමය 2018 වර්ෂයේ පළවන කාර්තුව අවසානයේදී සම්පූර්ණ කිරීමට සැළැසුම් කර තිබූ අතර එය 2019 වර්ෂයේ පළවන කාර්තුව දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේවෙතත්, භාරදීමට එරෙහිව ගෙවීම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ කටයුතු 2020 | කොළඹ කොටස් හුවමාරුව, භාරදීමට එරෙහිව ගෙවීම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වන අතර, මූල්‍ය අංශය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ පත් කර ඇති භාරදීමට එරෙහිව ගෙවීම් ක්‍රමය පිළිබඳ විශේෂඥවරයාගේ අදහස් විමසා කොළඹ කොටස් හුවමාරුවට ප්‍රතිපත්තිමය මගපෙන්වීම සැපයීමෙන් කොමිෂන් සභාව මෙම මූලපිරීමට පහසුකම් සපයයි.<br>කෙසේ වෙතත්, COVID 19 වසංගතය හා අවශ්‍ය දෘඩාංග හා අනෙකුත් අවශ්‍යතාවයන් ආනයනය කිරීම සඳහා සැලකියයුතු කාලයක් | භාරදීමට එරෙහිව ගෙවීම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කිරීම සඳහා පසුවිපරම් ක්‍රියාවලිය වේගවත් කිරීම. |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 31 දින වන විටත් කෙරීගෙන යමින් පැවතුණි. | වැයවීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියට බලාපොරොත්තු වූවාට වඩා වැඩි කාලයක් ගතවී ඇත. එසේ වුවද, කොමිෂන් සභාව ආරම්භයේ සිටම අවශ්‍ය රීති හා රෙගුලාසි අනුමත කරමින් සහ නිසි අධීක්ෂණ කාර්යය ඉටුකරමින්<br>භාරදීමට එරෙහිව ගෙවීම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම පසුවිපරම් කරන ලදි. කොළඹ කොටස් හුවමාරුව භාරදීමට එරෙහිව ගෙවීම් පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කර ආන්තික ආදර්ශය වැඩිදියුණු කළ අතර<br>2021 අගෝස්තු 16 දින සජීවීව ක්‍රියා කර ඇත.<br>තවද, ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ සුරැකුම්පත් සඳහා මධ්‍යම පාර්ශ්වීක යාන්ත්‍රණය ( CCP) ස්ථාපිත කිරීමට දැනටමත් පියවර ගෙන ඇති බවත්, එම ක්‍රියාවලිය අවසන් වූ පසු හිමිකම් සුරැකුම්පත් සඳහා (Equity Securities) ඔවුන්ගේ මධ්‍යම පාර්ශ්වීකරණ යාන්ත්‍රණය පුළුල් කිරීමෙන් කොමිසමට සම්බන්ධ වීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු සූදානම් කරන බව අවධාරණය කර ඇත. | |
| ඇ | 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 14 බි (2) අ වගන්තිය ප්‍රකාරව, එම පනත යටතේ අයකරනු ලබන සෙස් බදුවලින් වියදම් දැරීමට බලය දී ඇති, ප්‍රාග්ධන වෙළඳපොල හා නිෂ්පාදන සංවර්ධනයට සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 53.5 ක් අයවැය ගතකර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී ඒ වෙනුවෙන් රු. මිලියන 16.9 ක් හෙවත් සියයට 32 ක් පමණක් දරා තිබුණි. | 2020 වර්ෂය තුළ පැවති COVID 19 වසංගතය හේතුවෙන්, Road Shows (රු. මිලියන 8 ක් අයවැයගත කර තිබුණි) සහ ඒකක භාර සඳහා ප්‍රවර්ධන වැඩසටහන් ( මිලියන 10 ක් අයවැයගත කර තිබුණි) පැවැත්වීම නොකරන ලදි.<br>• මධ්‍ය පාර්ශවීකරණ ව්‍යාපෘතිය සම්බන්ධ උපදේශන ගාස්තු ( රු. මිලියන 12.5 ක් අයවැයගත කර ඇත) - කොළඹ කොටස් හුවමාරුවට මෙම ගෙවීම නොකිරීමට තීරණය කරන ලදි.<br>• තැරැව්කරු පසුපෙල කාර්යාල (Broker Back Office) හා ඇණවුම් කළමනාකරණ පද්ධති (රු. මිලියන 23 ක් අයවැය ගත කර තිබුණු අතර සත්‍ය වියදම රු. මිලියන 16.9 කි) - තැරැව්කාර සමාගම් විසින් තැරැව්කරු පසුපෙල කාර්යාල හා ඇණවුම් කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා කොළඹ කොටස් හුවමාරුව විසින් කොමිෂන් සභාවට සපයන ලද උපකාරක ලියවිලි මත පදනම්ව අරමුදල් ප්‍රතිපූරණය කරනු ලැබේ.<br>ඒ අනුව, කොළඹ කොටස් හුවමාරුව විසින් සපයන ලද උපකාරක ලියවිලි මත පදනම්ව, කොමිෂන් සභාව රු. මිලියන 18.6 ක් 2020 වර්ෂය තුළදී කොළඹ කොටස් හුවමාරුවට ප්‍රතිපූරණය කරන ඇත. කෙසේ වෙතත්, ඉතිරි අරමුදල් ප්‍රතිපූරණය කිරීම සඳහා කොළඹ | ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛතාව ලබා දීම. |

| | | | |
|---|---|---|---|
| | | කොටස් හුවමාරුව අවශ්‍ය කරන උපකාරක ලියවිලි කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. | |
| ඈ | 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 14 බි (2) අ වගන්තිය ප්‍රකාරව, එම පනත යටතේ අයකරනු ලබන සෙස් බදුවලින් වියදම් දැරීමට බලය දී ඇති මහ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්වලට සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 24.1 ක් අයවැය ගතකර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී ඒ වෙනුවෙන් රු. මිලියන 1.4 ක් හෙවත් සියයට 5.8 ක් පමණක් වියදම් කර තිබුණි. | බාහිර සබඳතා අංශය විසින් 2020 වර්ෂය සඳහා සැළසුම් කර අයවැයගත කර තිබුණු අයෝජකයින් වෙත ළඟාවීමේ වැඩසටහන්වලට COVID 19 වසංගතය නිසා ඇතිවූ වසාදැමීම් (Lockdown) දෙකකින් සීමා කිරීම් ඇති කරන ලදි. ප්‍රධාන වශයෙන්ම සමාජ මාධ්‍ය හරහා මාර්ගගත අයෝජක දැනුවත් කිරීමේ වැඩසටහන් වෙත යොමුවීමට අංශයට සිදුවූ අතර ඒවායේ අන්තර්ගතය ආයතනය තුළදීම නිර්මාණය කළ බැවින් පිරිවැය අඩුවීමකට හේතුවිය. | ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛතාව ලබා දීම. |
| ඉ | 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතට අනුව, 2018 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභාව හා එහි අරමුදල් ආදායම් බදු සඳහා වගකීමට යටත්වේ. කෙසේ වෙතත්, කොමිෂන් සභාව විසින් 2018/2019 සහ 2019/2020 තක්සේරු වර්ෂ සඳහා ආදායම් බදු 2020 නොවැම්බර් හා 2021 පෙබරවාරි ගෙවා තිබුණි. ඒ අනුව, අදාල තක්සේරු වර්ෂ සඳහා බදු ගෙවීම් ප්‍රමාදවීම හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් දඩමුදල් අයකිරීමට හැකියාව ඇත. | පෙර දේශීය ආදායම් පනත යටතේ ලබා ගත් පරිදිම, 2017 අංක 17 දරන නව දේශීය ආදායම් පනත ප්‍රකාරව ආදායම් බද්දෙන් නිදහස් කිරීමක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් හා මහා භාණ්ඩාගාරයේ අයවැය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවෙන් කොමිෂන් සභාව ඉල්ලා සිටින ලදි.<br>බදු නිදහස් කිරීම් තත්වය පිළිබඳව අපගේ ඉල්ලීම් පැහැදිලි කරමින් අයවැය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අවසාන ප්‍රතිචාරය 2020 නොවැම්බර් 9 වැනි දින ලැබී ඇත. ගෙවීම් ප්‍රමාදවීම, අදාල බලධාරීන්ගේ පැහැදිලිකිරීම් අපේක්ෂවෙන් සිටීම හේතුවෙන් සහ ගෙවීම් නොකිරීමට හේතුව ආදායම් බදු වාර්තාව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන අවස්ථාවේ දැනුම් දී ඇති බැවින් දඩ මුදල් අයකිරීමට ඇති හැකියාව ඉතා අඩු බව කොමිෂන් සභාව විශ්වාස කරයි. | බදු ගෙවීමේදී ආදායම් බදු නීතිවලට අනුකූලවීම. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

----------------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ | 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 43 (2) වගන්තිය ප්‍රකාරව, පත් කරන ලද නිලධරයන්ට සහ සේවකයින්ට කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තීරණය කරනු ලබන ආකාරය හා අනුප්‍රමාණ අනුව වැටුප් ගෙවිය යුතු අතර, කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තීරණය කරනු | කොමිෂන් සභාව විසින් ඉහත කාරණය සම්බන්ධයෙන් නීතිපතිතුමාගේ මතය විමසන ලද අතර ඊට ප්‍රතිචාර වශයෙන් කොමිෂන් සභාව සේවකයින් බඳවා ගැනීම හා වැටුප් පිළිබඳ සිය තීරණවලට අදාළව පූර්ව | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ නිර්දේශයට අනුකූලවීම |

| | | | |
|---|---|---|---|
| | ලබන සේවා කොන්දේසිවලට ඔවුන් යටත් විය යුතුය. තවද, 1992 මාර්තු 31 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ලිපිය ප්‍රකාරව, වෙනත් රජයේ රෙගුලාසි සලකා බැලීමෙන් තොරව සිය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සහ ඔවුන්ගේ වැටුප් හා අනෙකුත් දීමනා නියම කිරීම සඳහා කොමිෂන් සභාවට නිදහස තිබේ.<br><br>ඒ අනුව, කාර්ය මණ්ඩලයේ වැටුප් පරිමාණයන් සහ විශේෂ ජීවන දීමනාව, මාසික දීමනාව, කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම්, කාර්ය මණ්ඩල වාහන දීමනාව හා විශේෂ ගෙවීම් වැනි අනෙකුත් දීමනා කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් වරින් වර තීරණය කර තිබුණි.<br><br>කෙසේ වෙතත්, 2018 සැප්තැම්බර් 18 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා (කෝප්) රැස්වීමේ නිර්දේශයට අනුව, කොමිෂන් සභාව සිය කාර්ය මණ්ඩලයට ලබා දෙන වැටුප් හා දීමනා සම්බන්ධයෙන් ජාතික වැටුප් කොමිෂන් සභාවේ එකඟතාවය ලබා ගත යුතුය. කොමිෂන් සභාව විසින් 2021 සැප්තැම්බර් 30 දින වන විටත් එවැනි එකඟතාවයක් ලබාගෙන නොතිබුණි. | අනුමැතියක් හෝ අවසරයක් ලබා ගැනීමට නීතියෙන් අවශ්‍ය නොවන බව නීතිපතිතුමා විසින් උපදෙස් දී තිබේ. | |
| ආ | 2018 ජනවාරි 22 දිනට කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 96 ක් වූ අතර මෙම කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන තිබුණි. 2018 ජනවාරි 22 දින පැවති 404 වැනි කොමිෂන් සභා රැස්වීමේදී, කොමිෂන් සභාවේ වේතන කමිටුවේ තීරණ එනම් “භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 1992 මාර්තු 31 දිනැති විධානයට අනුව, කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කොමිෂන් සභාවේ සාමාජිකයින්ට නිදහස තිබේ නම් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සංයුතිය කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තීරණය කළ යුතු බව සහ අතීතයේ දී අනුගමනය කළ පරිදිම අනුමැතිය ලබා ගැනීම කොමිෂන් සභාව විසින් නතර කළ යුතු බව පැහැදිලි වේ” යන්න කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් අනුමත කර තිබුණි. ඒ අනුව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය 96 සිට 137 දක්වා වැඩි කර තිබුණි.<br><br>කෙසේ වෙතත්, 2018 ජූලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2018 අනුව, අදාළ බලධාරීන් විසින් මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව සේවකයින් බඳවා ගැනීමෙන් සහ සේවකයින්ගේ වැටුප් හා දීමනා වැඩි කිරීමෙන් වැලකී සිටිය යුතුය. නමුත්, කොමිෂන් සභාව විසින් වැඩි කරන ලද 41 ක් වූ කාර්ය මණ්ඩලය සඳහා එවැනි අනුමැතියක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබා ගෙන නොතිබුණි. | කොමිෂන් සභාව විසින් ඉහත කාරණය සම්බන්ධයෙන් නීතිපතිතුමාගේ මතය විමසන ලද අතර ඊට ප්‍රතිචාර වශයෙන් කොමිෂන් සභාව සේවකයින් බඳවා ගැනීම හා වැටුප් පිළිබඳ සිය තීරණවලට අදාළව පූර්ව අනුමැතියක් හෝ අවසරයක් ලබා ගැනීමට නීතියෙන් අවශ්‍ය නොවන බව නීතිපතිතුමා විසින් උපදෙස් දී තිබේ. | අදාල චක්‍රලේඛවලට අනුගතවීම |

| | | | |
|---|---|---|---|
| ඈ | 2018 ජනවාරි 22 දිනට අනුමත කාර්ය මණ්ඩලයට අයත් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනාරාල්, ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන අධ්‍යක්ෂක, විමර්ශන අධ්‍යක්ෂක, අධීක්ෂණ අධ්‍යක්ෂ, නීති හා බලගැන්වීම් සහකාර අධ්‍යක්ෂ හා ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන සහකාර අධ්‍යක්ෂක යන තනතුරු 2020 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය. | කොමිෂන් සභාවේ දැනට පවතින වැටුප් ව්‍යුහය හෝ අවශ්‍ය ගුණාංග සහිත නියමිත සුදුසුකම්ලත් අයදුම්කරුවන් සොයා ගැනීමට නොහැකිවීම හේතුවෙන් සියලුම පුරප්පාඩු පිරවීම අභියෝගාත්මක වුවද, ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන අධ්‍යක්ෂක, විමර්ශන අධ්‍යක්ෂක, අධීක්ෂණ අධ්‍යක්ෂ, මානව සම්පත් අධ්‍යක්ෂ ඇතුළුව දැනට පවතින ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු පිරවීමට කොමිෂන් සභාව සම්මුඛ පරීක්ෂණ කිහිපයක් පවත්වන ලදි. කෙසේ වෙතත්, සංවිධානයේ මෙහෙයුම් අවශ්‍යතා මත පදනම්ව පුරප්පාඩු පිරවීමට අවශ්‍ය පියවර කොමිෂන් සභාව අඛණ්ඩව ගනු ලැබේ. | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු පිරවීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම. |
| ඈ | 2016 අප්‍රේල් 19 දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභාවේ එක් නිලධාරියෙකුගේ සේවය තහනම් කර තිබුණි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 31.11 උප වගන්තියට පටහැනිව වාහන දීමනාව හා අනෙකුත් ප්‍රතිලාභ හැර මාසික දළ වැටුපෙන් හරි අඩකට සමාන මුදලක් ගෙවීම් කර තිබුණි. 2016 අප්‍රේල් 20 සිට 2018 අගෝස්තු 31 දක්වා කොමිෂන් සභාව විසින් ඔහු වෙනුවෙන් දරන ලද අර්ධ මාසික වැටුප් වියදම රුපියල් 5,212,815 ක් විය.<br>2018 සැප්තැම්බර් 18 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (කෝප්) රැස්වීමේ නිර්දේශයට අනුව, කොමිෂන් සභාව වැටුප් ගෙවීම නැවැත්විය යුතු අතර ගෙවන ලද මුළු වැටුප අය කර ගැනීමට කටයුතු කළ යුතුය. ඒ අනුව, 2018 සැප්තැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි අර්ධ මාසික වැටුප ගෙවීම නවතා තිබූ අතර ඉහත සඳහන් මුදල ආපසු ගෙවන ලෙස 2018 නොවැම්බර් 15 දිනැති ලිපියෙන් නිලධාරියාට දන්වන ලදී. කෙසේ වෙතත්, කොමිෂන් සභාව විසින් 2020 දෙසැම්බර් 31 දින වන විටත් එය අය කරගෙන නොතිබුණි. | කොමිෂන් සභාව විසින් සේවය තහනම් කරන ලද සේවකයාට මාස භාගයක වැටුප ගෙවීම අත්හිටුවා ඇති අතර 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂයක් ලෙස ගෙවා ඇති මුදල හඳුනාගෙන තිබේ. තවද, කොමිෂන් සභාව විසින් මෙහි සඳහන් රු. මිලියන 5.2 ක මුදල පියවීම සඳහා ලිපි මඟින් සිහිකැඳවීම් කිහිපයක් දැනටමත් යවා ඇත. ඔහු විසින් කොමිෂන් සභාව වෙත පිළිගැනීමක් (Acknowledgement) එවා තිබුණි. කෙසේ වෙතත්, ඔහු අද වන තුරු මුදල් තැන්පත් කර නොතිබුණි. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශය අනුව ගෙවන ලද මුළු වැටුප අය කර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම. |

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1** **අයවැය ලේඛනමය පාලනය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| අයිතම් 14 ක අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර සියයට 32 සිට සියයට 175 දක්වා පරාසයක සැලකියයුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන්, අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබු බව නිරීක්ෂණය විය. | වාර්තාකරන දිනට ආයුගණක තක්සේරුවේ ඇති උපකල්පනවල වෙනස්වීම් හේතුවෙන් සත්‍ය පාරිතෝෂික වියදම අයවැයගත ප්‍රමාණය ඉක්මවා තිබුණි.<br>COVID 19 වසංගතයේ බලපෑම හේතුවෙන් විධායක යැපුම් දීමනාව හා බඳවා ගැනීම් ප්‍රචාරණය සම්බන්ධ වියදම් අඩුවෙන් වියදම්වන ලදි.<br>නව සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත සම්බන්ධව ධාරිතා වර්ධනය වෙනුවෙන් අයවැයගත මුදල 2020 වර්ෂය තුළදී දරා නොතිබුණි. | අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගැනීම |